මිනිසෙකු තම නිදියහනේ වැතිර සිටිය දී ඔහු වෙත මා ගැන හදීසයක් ළඟා විය හැකි නොවේ ද. එවිට ඔහු අප අතර හා ඔබ අතර අල්ලාහ්ගේ ග්රන්ථය

අල්-මික්දාම් ඉබ්නු මඃදීකරිබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පැවසූහ: "මිනිසෙකු තම නිදියහනේ වැතිර සිටිය දී ඔහු වෙත මා ගැන හදීසයක් ළඟා විය හැකි නොවේ ද. එවිට ඔහු අප අතර හා ඔබ අතර අල්ලාහ්ගේ ග්රන්ථය" ඇත. එහි අපි කවර කරුණක් 'හලාල්' -අනුමත- යැයි දැක ඇත්තේ ද එය අපි අනුමත කර ගත්තෙමු. කවර කරුණක් 'හරාම්' -තහනම්- යැයි දැක ඇත්තේ ද එයි
අපි තහනම් කර ගත්තෙමු. සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්)
කවර කරුණක් තහනම් කළේ ද එය අල්ලාහ් තහනම් කළා හා සමානය." [صحيح] [رواه أبو داود والترمذي وابن ماجه]

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ දන්වා සිටියහ: වාඩි වී සිටින මිනිසුන් පිරිසක් සිටින කාලයක් එළඹ ඇත. ඔවුන්ගෙන් කෙනෙකු තම ඇඳ මත වැතිර සිටිය දී ඔහුට නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ හදීසයක් දන්වනු ලැබේ. එවිට ඔහු මෙසේ පවසනු ඇත: කටයුතුවල දී අප අතර සහ ඔබ අතර වෙන් කරන ලද දෑ වනුයේ ශුද්ධ වූ අල් කුර්ආනයයි. එය අපට ප්රමාණවත්ය. මන්ද එහි හලාල් නිත්යානුකූල යැයි පෙනී ගිය යමක් වී නම් අපි ඒ අනුව ක්රියා කළ බැවින් හා එහි තහනම් යැයි අපට පෙනී ගිය යමක් වී නම් අපි එයින් ඉවත් වූ බැවිනි. පසු ව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැහැදිලි කළහ. තමන් තම සුන්නාහ්වෙහි තහනම් කළ හෝ වැළැක් වූ සෑම දෙයක්ම, අල්ලාහ් ඔහුගේ ග්රන්ථයේ තහනම් කළ දෑට සමාන නීති ස්වභාවයක් එයට ද ඇත. මක්නිසාද යත් එතුමාණන් තම ස්වාමියාගෙන් එය ලබන බැවිනි.

http://www.sunnah.global/hadeeth/si/show/65005